* රු.87,630,420/- ක මු ළු පොලී මුදල 2005.11.14 දිනැති බදු ගිවි සුම ප්‍රකාර මීළඟ වසර 30 ක් තුලදී ක්‍රමක්‍ෂය කරනු ඇත. මේ අනුව ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් ලෙසට යාබදව වෙනම අයිතමයක් ලෙස මෙම මුදල පෙන්වා ඇත. පසුගිය වර්ෂයේදී විගණකාධිපති විසින් මේ පිළිබඳව විවිධ අදහස් දක්වා ඇත. හැකි පරිදි එය නැවත සලකා බලනු ලැබේ.

උප සටහන 06

1 තැන්පතු -- 2011

| බැංකුව | මුදල | සිට | දක්වා | අනුපාතය | 2011 | 2012 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 419,580,000.00 | 2011 මැයි 25 | 2012 මැයි 25 | 9.0% | 220 | 145 | 22,760,778.08 | 15,001,421.92 |
| එකතුව | 419,580,000.00 | | | | | | 22,760,778.08 | 15,001,421.92 |

2 පාසල් සංවර්ධන අරමුදල් තැන්පතු - 2011

| බැංකුව | මුදල | සිට | දක්වා | අනුපාතය | 2011 | 2012 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 504,109,589.04 | 2011 දෙසැ. 15 | 2012 අප්‍රේල් 16 | 10.00% | 16 | 106 | 2,209,795.46 | 14,639,894.91 |
| ලංකා බැංකුව | 105,916,287.30 | 2011 දෙසැ. 15 | 2012 අප්‍රේල් 16 | 10.00% | 16 | 106 | 464,290.57 | 3,075,925.06 |
| ජා.සං.බැ. * | 5,444,764.25 | 2011 ජන. 27 | 2012 ජනවාරි 27 | 9.25% | 338 | 26 | 466,385.08 | 35,875.78 |
| එකතුව | 615,470,640.59 | | | | | | 3,140,471.10 | 17,751,695.75 |

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**
**මූල්‍ය ප්‍රකාශන - 31.12.2011**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1 පොදුවේ පිළිගත් ශ්‍රී ලංකා ගණකාධිකරණ ගිණුම් ප්‍රතිපත්ති හා ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇත.

2 අරමුදල් කළමණාකරු වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) වාර්තා කල පරිදි භාණ්ඩාගාර බැදුම්කර / බිල්පත් ආදියෙහි ආයෝජනයන් එහි පිරිවැය හෝ ඒවා පරිණත වීමේදී පවතින උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත භාරකාර අරමුදල ගිණුම් ගත කර ඇත.

3 අරමුදල් කළමණාකරු වන NWCL ආයතනය වාර්තා කල පරිදි පොලී ආදායම උපචිත පදනම මත සැලකිල්ලට ගනු ලැබේ.

4 සංවර්ධන ලොතරැයියෙන් ලැබෙන ලාභාංශ ප්‍රකාශණයට පත්කිරීමෙන් පසුව පිළිගෙන මූල්‍ය වර්ෂය පදනම මත ගිණුම් ගත කරනු ලැබේ. මෙම ආදායම හැකිතරම් දුරට සෘජුව සමුච්චිත අරමුදලට මාරු කරනු ලැබේ.

5 ඒක්ෂණ හා කෙටි කාලීන තැන්පතු හැර ඉපයීම සඳහා යොදාගත් අරමුදල් ඒවායේ පිරිවැය අනුව කාල පරිච්ඡේදානුකූලව අයිතම ගත කරන ලද ආයෝජන යටතේ වර්ගීකරණය කොට දක්වා ඇත.

6 අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය ඉහල පොලී අනුපාතයක් ලබාගැනීම හා අඩු අවදානමක් මත පදනම් වී ඇත. එමනිසා පොලී අනුපතයන්ගේ ප්‍රවණතාවයන් මත භාණ්ඩාගාර ආයෝජනයන්හි හෝ බැංකු තැන්පතු අතර අරමුදල් ආයෝජනය කිරීමට තිරණය වේ.

7 1981 අංක 66 දරණ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතෙහි 12 වගන්තිය ප්‍රකාර මහපොළ අරමුදල සියළුම බදු වලින් නිදහස්ය.

8 වත්කම් වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයු කාලය පදනම් කරගෙන සරල මාර්ග ක්‍රමය මත පහත සඳහන් අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදන සළසනු ලැබේ.

| | | |
|---|---|---|
| වාහන | 20.00% | (වාර්ෂිකව) |
| කාර්යාල උපකරණ | 20.00% | (වාර්ෂිකව) |
| බොක්ස් ෆයිල්ස් | 25.00% | (වාර්ෂිකව) |
| පරිගණක උපකරණ | 25.00% | (වාර්ෂිකව) |

9 පූර්ණ වශයෙන් ක්ෂය ප්‍රතිපාදනය කොට ඇති වැදගත් නොවන අයිතමයන් කිහිපයක් ඒවායේ සත්‍ය හා සාධාරණ බලපෑමක් ශේෂ පත්‍රයට සිදු නොවන නිසා ප්‍රත්‍යාගණනය කොට ඇත.

10 මහපොළ භාරකාර අරමුදල මගින් තීරණය කර ඇති පරිදි භාණ්ඩාගාර අංශය හා ව්‍යාපෘති අංශය වශයෙන් අංශ දෙකක් යටතේ මහපොළ වියදම් වර්ගීකරණය කොට ඇත. 2004 මාර්තු මාසයෙන් පසු ව්‍යාපෘති අංශය වසා දමා ඇත.

11 i. අරමුදලේ ඉපයුම් ධාරිතාවයට බලපෑමක් නොවන ව්‍යාපෘතීන් සඳහා ලබා දෙනු ලබන ද්‍රව්‍යමය ආකාරයේ පරිත්‍යාග හා වත්කම් ලැයිස්තුව අරමුදලේ ශේෂ පත්‍රයට ඇතුලත් කර නොමැත.

ii. අරමුදලේ ඉපයුම් ධාරිතාවයට බලපෑමක් නොවන පරිදි ප්‍රාග්ධනය ස්වභාවයෙන් අනෙකුත් ආයතන වෙත ලබාදෙනු ලබන පරිත්‍යාග හා ප්‍රදාන එම ව්‍යාපෘතිය යටතේ වර්ෂය තුළදී දරන ලද වියදම් ලෙස කපා හරිනු ලැබේ. පසුගිය වසරෙහි ප්‍රාග්ධන වියදම් හා සම්බන්ධ වියදම් ලැයිස්තුවක් සටහන් වල සඳහන් කර ඇත.

12 ආයෝජනයේ වටිනාකම ඉහළ ගොස් ඇති නිසා ජාතික සංවර්ධන බැංකුවෙන් භාරගත් රු.මිලියන 175 ක ණය මුදල වෙනුවෙන් ගෙවන ලද පොලිය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය සඳහා වැය කල ආයෝජන වියදම් ලෙස ප්‍රාග්ධනීත කර ඇත. කෙසේ වෙතත් නව ගිවිසුම යටතේ මෙම ආයෝජනය මහපොළ භාරකාර අරමුදලේ වත්කමක් ලෙස දැක්වෙන අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය වෙත එය බදුකරයක් මත ලබාදී ඇත. එම නිසා මිළඟ මූල්‍ය වර්ෂයේ සිට මෙම ක්‍රියාදාමයෙන් වෙනස් වනු ඇත. ජාතික සංවර්ධන බැංකු ශේෂය පියවා ඇත. කෙසේ වුවද ගෙවන ලද පොලිය අවුරුදු 30 ක් සඳහා බලරහිත කරන ලදි.

13 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය පියවන ලද ඉදිකිරීම සඳහා අවශ්‍ය මුදල් තොරතුරු තාක්ෂණ (ගැරන්ටි) සමාගම වෙත ගෙවා ඇත. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සමාගම සමග ඇති බදු ගිවිසුමේ ආයෝජන වියදම් ලෙස මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ සමුච්චිත වියදම් ශේෂපත්‍රයේ ආයෝජනය ලෙස දක්වා ඇත.

14 (a) වසර 8 ක් සඳහා මාලබේ මහපොළ කැම්පස් වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමග අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම වෙනුවට දෙපාර්ශවය විසින් 2005.11.14 දින අඛණ්ඩව වසර 30 බැගින් වන කාල පරිච්ඡේද දෙකක් සඳහා වසර 60 ක බදුකරයක් වෙනුවෙන් නව ගිවිසුමක් අත්සන් තබන ලදි.

එහි මූලික අංග පහත දක්වා ඇත.

i. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මගින් වාර්ෂිකව එහි ශුද්ධ ලාභයෙන් මිලියන 8 ක මුදලක් හෝ 20% යන දෙකෙන් ඉහළ වටිනාකම මහපොළ අරමුදල වෙත ගෙවිය යුතුය.

ii. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව සඳහා මහපොළ ශිෂ්‍යත්ව 25 ක් ප්‍රදානය කිරීම.

iii. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් 1/3 ක් මහපොළ අරමුදල මගින් නියෝජනය වන පරිදි භාරකාර අරමුදලේ සාමාජිකයින් 5 දෙනෙකු එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම.

ගිවිසුම අනුව අදාල නවීකරණයන් ක්‍රියාත්මක කරනු ලැබීන.

(b) මෙම ගිවිසුමේ පහත සඳහන් කරුණු ආශ්‍රිතව බල පැවැත්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් වනු ඇත.

i. 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී.ල.තො.තා.ආ.ආයෝජන වටිනාකම ගිවිසුමේ සඳහන් වටිනාකම වන රු.373,579,392 ක් වනු ඇත.

ii. රු.මිලියන 175 ක ණය ශේෂය සඳහා වන පොලිය වියදමක් ලෙස සලකනු ඇත.

iii. නව ගිවිසුම යටතේ 2007 වර්ෂයේ සිට ඇතුලත් වන සිසුන් සඳහා ශිෂ්‍යත්ව 25 ක් ප්‍රදානය කිරීම සිදු කරනු ඇත.

iv. මහපොළ කැම්පස්හි ගොඩනැගිලි පිරිවැය 2006 වර්ෂයේ සිට ක්ෂය කරනු ඇත.

v. මහපොළ භාරකාර අරමුදල සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර කලින් පැවති අවබෝධතා ගිවිසුම අහෝසි වනු ඇත.

15 අරමුදල කළමණාකරණය කිරීම පිණිස අත්සන් තැබූ ගිවිසුමක් යටතේ 2004.02.19 දින මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ වශයෙන් කොටස් හිමි පරිපාලිත සමාගමක් ලෙස නැෂනල් වෙල්ත් කෝපරේෂන් වෙත මහපොළ ආයෝජන බාර දෙන ලදි. සියළුම වියදම් උපචිත පදනම මත අය කර ගත් පසු නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් උපයනු ලබන ශුද්ධ ඉපයුම අදාල ආයේජන වලින් උත්පාදනය වූ ඉපයුම ලෙස මහපොළ භාරකාර අරමුදලේ ගිණුම් ගත කරනු ලැබේ. මහපොළ අරමුදල වෙත සිදු කල ප්‍රේෂනයන් හැරුනු විට ශුද්ධ ඉපයුම් ද ආයෝජන වලින් ලද ලාභ ලෙස එකතු කරනු ලැබේ.

16 අරමුදල් කළමණාකරණ ගිවිසුම යටතේ පහත සඳහන් පරිදි ආයෝජන වර්ග දෙකක් පවත්වාගෙන යාම සඳහා නැෂනල් වෙල්ත් කෝපරේෂන් එකඟවී ඇත.

17 නැෂනල් වෙල්ත් කෝපරේෂන් පූර්ණ වශයෙන් කොටස් හිමි පරිපාලිත සමාගමක් වන බැවින් ආයෝජන කළමණාකරණය වශයෙන් මහපොළ අරමුදලේ ආදායම ලෙස ශුද්ධ ප්‍රතිඵලය එකතු කරනු ලැබේ.

18 සමානතාවයක් නොදක්වන ක්‍රියාකාරකම් සහ ඒවායේ ස්වභාවය හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ සකස් කරනු නොලැබේ.

19 අත්තිඩිය ඉඩම විකිණීමෙන් ලද මූල්‍ය ආදායම පාසල් සංවර්ධන අරමුදලේ ප්‍රාග්ධනය ලෙස වෙන් කොට ඇත. එම ප්‍රාග්ධනය මත පොලී ආදායම මගින් පාසල් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ.

20 2009 ඔක්තොබර් මසදී නැවත මහපොළ වෙළඳ ප්‍රදර්ශණ ආරම්භ කරන ලද අතර එය වාණිජ මට්ටමින් වෙළඳාම හා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අද හසින් කැබිනට් අමාත්‍ය අනුමැතියක් මත පාසල් සංවර්ධනය කටයුතු සඳහා ආදායම් ඉපයීමේ අරමුණ ද ඇතිව වෙළඳ අමාත්‍යාංශය මගින් බෙලිඅත්තේදී පවත්වන ලදි. එහිදී යම් අතිරික්ත ආදායමක් ලැබුනහොත් එය පාසල් සංවර්ධන අරමුදලට ලබාදිය යුතු වේ. කොසේවෙතත් මෙතෙක් එම අතිරික්ත ආදායම හඳුනාගෙන නොමැත. කෙසේ වුවද සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් පවත්වන ලද බෙලිඅත්ත මහපොළෙහි මේ දක්වා අතිරික්තයක් හඳුනාගෙන නැති අතර පාසල් සංවර්ධන අරමුදල සඳහා ලබා දිය හැකි ආදායමක් නොමැති බව දැනුම් දී ඇත.

මගේ අංකය : ටීසී/ඊ/එම්එච්ඊඑස්ටීඑෆ්/එෆ්ඒ/2011 2012 ජනවාරි දින.

සභාපති,

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 66 දරන මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගනනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2011 නොවැම්බර් 01 දින සිට අරමුදල ජනාධිපති ලේකම් කාර්යාලය යටතට පත් කර තිබුණද, විගණනයට ඉදිරිපත් කළ 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල භාර මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහතික කිරීම කර තිබුණේ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් විසිනි. එසේම, 2011 වර්ෂයට අදාල කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර 2012 අප්‍රේල් 27 දින නැවතත් සංශෝධිත කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලදී.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 26 ට අනුව, අරමුදලට පූර්ණ අයිතියක් ඇති සීමාසහිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවද, 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීමට අරමුදල ක්‍රියා කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු මහපොල වෙළඳ ප්‍රදර්ශනයෙන් ලැබිය යුතු රු.3,270,082 ක් වූ අතිරික්ත ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) ආයෝජන කර තිබුණු මුළු මුදල රු.461,207,812 වුවද, තොරතුරු තාක්ෂණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලවල එය රු.373,577,393 ක් ලෙස දක්වා තිබුණෙන් රු.87,630,420 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙම වෙනස දිගුකාලීනව කපා හරින බව සටහන අංක 01 හි අනාවරණය කර ඇත.

### 2.2.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මු.රෙ. 264 | ආදායකයා විසින් මුදල් ලබා ගත් බවට සහතික කෙරෙන කුවිතාන්සි ලබා ගත යුතු වුවද, එකතුව රු.49,414,250 ක් වූ ශිෂ්‍යත්ව ගෙවීම් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. |
| (ඇ) මු.රෙ. 396 (ඇ) | අරමුදලින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ එකතුව රු.2,628,700 ක වටිනාකමැති චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, පෙර වර්ෂ ගැලපුම්වලට සහ පාඩු හා කපා හැරීම්වලට පෙර අරමුදලේ අතිරික්තය රු.421,249,846 ක් වූ අතර, එයට අනුරූපව, පෙර වර්ෂ ගැලපුම්වලට සහ පාඩු හා කපා හැරීම්වලට පෙර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.435,069,815 ක් වූයෙන් රු.13,819,969 කින් මූල්‍ය ප්‍රතිඵල වල පිරිහීමක් දක්නට ලැබුණි. ඒ සඳහා 2011 වර්ෂයේදී නැට්වෙල්ත් ලාභාංශ ආදායම නොලැබීම මූලිකව බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

අරමුදල මගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම පිළිබඳ තොරතුරු හා වැදගත් සංඛ්‍යා ලේඛන සමහරක් පහත දැක්වේ.

| වර්ෂය | විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව | විශ්ව විද්‍යාල සඳහා පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගත් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | කාර්මික විද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සඳහා පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා දරන ලද වියදම | ශිෂ්‍යත්ව ප්‍රදාන උත්සව වියදම් |
|---|---|---|---|---|---|---|---|
| | | | % | | | රු. | රු. |
| 1999/2000 | 11,324 | 5,958 | 52.6 | 550 | 6,508 | 229,443,550 | 5,118,665 |
| 2000/2001 | 11,717 | 6,275 | 53.5 | 601 | 6,876 | 245,651,650 | 2,982,856 |
| 2001/2002 | 11,380 | 6,206 | 54.5 | 417 | 6,623 | 362,024,850 | 3,690,075 |
| 2002/2003 | 23,568 | 12,246 | 52.0 | 522 | 12,768 | 379,473,500 | 4,622,591 |
| 2003/2004 | 12,623 | 8,147 | 64.5 | 550 | 8,697 | 437,707,100 | 785,597 |
| 2004/2005 | 13,653 | 9,000 | 65.9 | 847 | 9,847 | 487,929,950 | 516,476 |
| 2005/2006 | 15,478 | 8,009 | 51.7 | 1,335 | 9,344 | 644,682,550 | 941,490 |
| 2006/2007 | 15,996 | 7,799 | 48.8 | 1,045 | 8,844 | 717,665,900 | 3,050,987 |
| 2007/2008 | 18,714 | 9,500 | 50.7 | 1,663 | 11,163 | 711,135,000 | 1,328,963 |
| 2008/2009 | 19,340 | 10,000 | 52.0 | 1,500 | 11,500 | 695,747,550 | 2,057,249 |
| 2009/2010 | 20,111 | 10,000 | 49.72 | 1,564 | 12,574 | 763,746,500 | 2,035,922 |
| 2010/2011 | 20,274 | 10,300 | 50.80 | 1,500 | 11,800 | 694,519,600 | 2,876,999 |

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව ලබාදීම

2011 වර්ෂය තුළ අරමුදලින් ලබාදුන් ශිෂ්‍යත්ව හා ඊට අදාල ගෙවීම් පිළිබඳ විස්තර පහත පරිදි විය.

| අධ්‍යයන වර්ෂය | 2007/2008 | 2008/2009 | 2009/2010 |
|---|---|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රවේශය ලත් සිසුන් සංඛ්‍යාව | 18,714 | 19,340 | 20,111 |
| අරමුදලේ භාර මණ්ඩලය විසින් විශ්ව විද්‍යාල සඳහා වෙන් කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | 9,500 | 10,000 | 10,000 |
| පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | 8,787 | 9,006 | 8,868 |

මේ සම්බන්ධයෙන් හා ඊට අදාල ගෙවීම් පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අරමුදල විසින් ශිෂ්‍යත්වලාභීන්ට මුදල් ගෙවීමේදී එක් එක් මාසය සඳහා නියමිත අවසාන දිනයක් තීරණය කර ගෙවීම් කිරීමට විශ්ව විද්‍යාල වලට උපදෙස් ලබා දී තිබුණද, ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා වාරික ගෙවීමෙන් පසු ඉතිරි වන මුදල් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) නියැදි පරීක්ෂාවට අනුව, විශ්ව විද්‍යාල 05ක ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීම මාස 01 සිට මාස 10 දක්වා කාලයක් හිඟ හිට තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පාසැල් සංවර්ධන කටයුතු

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂනය විය.

(I) 2011 ජූනි 30 දින වනවිට පන්ති කාමර සහිත ශ්‍රවණාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මාලඹේ පිරිමි විද්‍යාලයට රු. 4,366,838 ක් ලබා දී තිබුණු අතර 2011 ජූනි 21 දින සිදු කල භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 ජනවාරි 18 දින අධ්‍යාපන අමාත්‍යාංශය හා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු අතර එළඹී තිබුණු ගිවිසුමට අනුව, ද්විතියික අධ්‍යාපන හා නවීකරණ ව්‍යාපෘතිය මගින් අරමුදල් ලබාගෙන ඉහත ගොඩනැගිල්ලේ අදියර I හි ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. ගිවිසුම්ගත මුදල රු.4,022,269 (වැට් රහිත) ක් විය. නමුත් අංක ඊඩී/07/99/07/12/10 හා 2010 ඔක්තෝබර් 28 දිනැති ලිපිය අනුව, ඉහත ගොඩනැගිල්ලේ අදියර I හි ඉදිකිරීම් කටයුතු සඳහා මහපොළ අරමුදලින්ද රු.4,366,838 මුදලක් යොදා ගත් බව දැක්වෙතත් මහපොළ අරමුදලින් එහි ඉදිකිරීම් කටයුතු සිදු කර නොතිබුණි.

(ii) 2010 දෙසැම්බර් 08 දින ඉහත සඳහන් රු.4,366,838 ක මුදල අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණද, එය තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එම මුදල් ඒ වනවිටත් වෙනත් පාසල්වල ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීමට තිබූ රු.4,193,629 ක් වූ හිඟ මුදල් ගෙවීම සඳහා යෙදවීමට යෝජනා කර තිබුණි.

(iii) 2010 පෙබරවාරි 06 දින මෙම ස්ථානයේ තිබූ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර පංති කාමරවල සිටි සිසුන් තාවකාලික ගොඩනැගිල්ලක රඳවා තිබුණි. නව ගොඩනැගිල්ල සම්පූර්ණ කර සිසුන් එම ගොඩනැගිල්ලට මාරු කිරීම වහාම කළ යුතුව තිබුණද 2011 ජූනි මස වන විට ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි.

(II) හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ ක්‍රීඩාංගණය නවීකරණය කිරීම සඳහා රු. 22,317,500 ක් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අංක 50/05 භාර මණ්ඩල පත්‍රිකාව මගින් මේ සඳහා රු.මිලියන 20 ක් වෙන්කර තිබුණද පසුව එම මුදල රු.මිලියන 25 දක්වා වැඩි කර තිබුණි. 2010 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.24,046,747 ක මුදලක් ගෙවා තිබුණු නමුත් විගණිත දිනය වූ 2011 ජූනි 20 දින වන විටත් ඉහත කී වැසිකිළි හා නාන කාමර පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ii) ඉහත ඇස්තමේන්තු අංක 02 අනුව පොළොව සැකසීම සඳහා රු.13,247,500 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම කටයුතු නිසියාකාරව සිදු නොකිරීම නිසා ක්‍රීඩා පිටියට දැඩි හානි සිදුවී තිබීම හේතුවෙන් එම පාසලේ නිවාසාන්තර ක්‍රීඩා කටයුතු පැවැත්වීම අඩාලවී තිබුණි. එහෙයින් අනෙකුත් පුහුණුවීම් කටයුතු සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවීම වැනි අවාසිදායක තත්ත්වයන්ට පාසලට මුහුණ දීමට සිදුවී තිබුණි.

4.3 **අවිධිමත් ගනුදෙනු**

---------------------

අරමුදල විසින් 2008 අප්‍රේල් 07 දින සිට වසර 04 ක කාලයක් සඳහා පිටපතකට රු.2.30 බැගින් (වැට් සමඟ) මසකට අවම පිටපත් 3,000 ක් ලබා ගැනීමේ කොන්දේසි මත බහුකාර්ය පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා 2011 අගෝස්තු දක්වා ගෙවා තිබුණු මුළු මුදල රු.364,369 ක් විය. ගිවිසුම අනුව මාසිකව අවම පිටපත් සංඛ්‍යාව ලබා ගැනීමට නොහැකි වීම නිසා ලබා නොගත් පිටපත් 6,144 ක් සඳහා රු.14,142 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4.4 **මතභේදයට තුඩුදෙන කරුණු**

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 39/03 හා 2002 මැයි 13 දිනැති භාර මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව, අරමුදල සතු අතිරික්ත මුදල්, තරඟකාරී මූල්‍ය වෙළඳපොළේ ආයෝජනය කිරීම තුළින් ඉහළ ඉපයීමක් කළ හැකි පරිදි අරමුදල් කළමණාකරනය කිරීමේ අපේක්ෂාවෙන් රු.200,000,000 ක මූලික ප්‍රාග්ධන දායකත්වයකින් සීමාසහිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, 2003 මාර්තු 23 දින ස්ථාපනය කර තිබුණි. කෙසේ නමුත්, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය ප්‍රකාර, මෙහි මුදල් ආයෝජනය සඳහා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත් අරමුදල විසින් 2011 දෙසැම්බර් 31 දිනට කළමනාකරණය පිණිස සමාගම වෙත භාර දී තිබුණු මුළු මුදල රු.5,125,204,995 ක් විය. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අරමුදල යෙදවූ රු.200,000,000 ක මූලික ප්‍රාග්ධනයට 2003 සිට 2007 වර්ෂය දක්වා එනම් වර්ෂ 05 ක් සඳහා කිසිම ලාභාංශයක් ලැබී නොතිබුණු අතර, 2008, 2009 හා 2010 වර්ෂ සඳහා ලාභාංශ ලෙස පිළිවෙලින් රු.මිලියන 5 ක්, රු. මිලියන 4.8 ක් හා රු.මිලියන 60.5 ලැබී තිබුණි. 2011 වර්ෂයේ භාර මණ්ඩල පත්‍රිකා අංක 52/09 අනුව, 2011 ඔක්තෝබර් 31 දිනට ඉහත සමාගමේ ලාභය රු.74,161,271 ක් වූ නමුත් 2011 වර්ෂය සඳහා අරමුදලට කිසිදු ලාශාංශයක් ලැබී නොතිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනට අරමුදල සතු රු. 5,125,204,995 ක අරමුදල් ඉහත සමාගම තුළ ආයෝජනය කිරීමෙන් රු.508,742,060 ක පොළී ආදායමක් උපයා තිබුණද, ඉන් රු.7,911,887 ක් අදාල සමාගමේ වත්කම් කළමනාකරණ ගාස්තු හා භාරකාර්ත්ව ගාස්තු ලෙස රු.9,653,445 ක් අඩු කිරීමෙන් පසු රු. 499,088,615 ක මුදලක් අරමුදල වෙත ගෙවා තිබුණි.

අරමුදල බදු වලින් නිදහස් ආයතනයක් වන බැවින් ඉහත මුදල් සාජුව ආයෝජනය කර තිබුණේ නම් රු. 9,653,445 ක් වූ මුදල ඉතිරි කර ගත හැකිව තිබුණි.

(iii) 2004 වර්ෂයෙන් පසුව ඉහත කී සමාගම අක්‍රිය තත්වයට පත් වී ඇති අතර තරගකාරීත්වයෙන් තොරව වෙළඳපොල තුල ක්‍රියාත්මක වීම නිසා තරගකාර පොලී අනුපාතයන්ටත් වඩා අඩු පොලියක් අරමුදලට ලැබී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය

------------------------------------------

(i) මහපොළ භාරකාර මණ්ඩලය හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර 2005 නොවැම්බර් 14 දින එළඹුන ගිවිසුමේ 4(බී) වගන්තිය අනුව, මහපොළ අරමුදලේ ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී හා තවත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් තිදෙනෙකු, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ යුතු වුවද, අරමුදලින් සාමාජිකයින් දෙදෙනෙකු හා අරමුදලට පිටතින් සාමාජිකයින් තිදෙනෙකු වශයෙන් සාමාජිකයන් පස් දෙනෙකු පත් කර තිබුණි.

(ii) ගිවිසුමේ 5(අ) (ii) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා ශිෂ්‍යත්ව 25 ක් භාර අරමුදල නමින් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු වුවද, මේ දක්වා ශිෂ්‍යත්ව පිරි නැමීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගිවිසුමේ 4(ඕ) වගන්තිය අනුව, අරමුදල විසින් බදු ලබා දී තිබූ භූමිය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් වසර දහයක් තුළ සංවර්ධනය කළ යුතු අතර, එසේ යොදා නොගනනේ නම් එම භූමිය වෙනත් ව්‍යාපෘතියකට යෙදවීමට අරමුදලට හිමිකම් තිබුණද, ඉහත කී වසර දහයක කාල සීමාවෙන් වසර 05 ක් ඉක්ම වී තිබුණද 2012 දෙසැම්බර් 18 දින දක්වාත් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 05 | 04 | 01 |
| මාණ්ඩලික නොවන | 11 | 04 | 07 |
| කණිෂ්ඨ | 03 | 02 | 01 |
| | 19 | 10 | 09 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත සේවක සංඛ්‍යාව 19 ක් ලෙස දැක්වුවද, ඒ සඳහා අංක 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) අරමුදලේ මාණ්ඩලික තත්ත්වයේ තනතුරු 03 ක් පුරවා තිබුණේ , වයස් සීමාව අවුරුදු 60 ඉක්මවූ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් එක් නිළධාරියෙකුගෙන් හා වැඩ බැලීමේ පත්වීම් 02 ක් මගිනි.

(ඇ) අරමුදලේ ප්‍රධාන විධායක වන අධ්‍යක්ෂවරයාද වයස අවුරුදු 60 ඉක්මවූ හා මාසිකව රු.12,000 ක වැඩ බැලීමේ දීමනාවක් ලබා ගන්නා නිළධාරියෙකු විය.

(ඈ) කණිෂ්ඨ සේවයේ යොදවා සිටි සේවකයින් දෙදෙනාද අනියම් පදනම මත බඳවා ගෙන තිබුණු අතර එම සේවකයින්ට සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරියාට අංක 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 ට අනුව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ සභාපතිවරයා වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අරමුදල් කළමණාකරනය
(ඇ) ශිෂ්‍යත්ව
(ඈ) පාසල් සංවර්ධන අරමුදල
(ඉ) කාර්ය මණ්ඩලය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව පිළිබඳ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි නිරීක්ෂණ හා කරුණු පැහැදිලි කිරීම්

විගණකාධිපතිගේ අංක ටීසී/ඊ/එම්එච්ඊඑස්ටීඑෆ්/එෆ්ඒ/2011 හා 2013 ජනවාරි 03 දිනැති වාර්තාව හා බැදේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.2.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණයට අනිවාර්යෙන් ඇතුලත් විය යුතු සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි 2011 වර්ෂයේ ලාභංශය එම ආයතනයෙහි අවසන් ගිණුම් පිළියෙල කල පසුව ලබා ගෙන ගිණුම යාවත්කාලීන කර නැවත ඉදිරිපත් කරන ලදි.

2.2.2 <u>ගිණුම්කරණ ප්‍රමිති</u>

ඉදිරියේදී මේ සඳහා ක්‍රියාකරනු ලැබේ.

2.2.3 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 2-9/MTF/2009 හා 2011.02.24 දින ලිපිය අනුව මෙම අරමුදලට ගෙවීමට මුදල් නොමැති බව දන්වා ඇත. එබැවින් මුදල් නොලැබෙන බව තහවුරු වු පසුව එය වැරදි මුදලක් වන බැවින් ගිණුමට ඇතුලත් කල නොහැක.

(ආ) විගණකාධිපතිගේ නිරීක්ෂණ අනුව 2006 සිට ගිවිසුම් කාලය වසර 30ක තුල ප්‍රාග්ධනගත කරන ලද රුපියල් මිලියන 175ක ණය සඳහා වු රු. 87,630,420/= ක පොලිය මහපොළ අරමුදලෙහි පොත්වලින් කපා හරින ලදි. තොරතුරු තාක්ෂණ ආයතනයෙහි ඉදිකිරීමට ලබා දුන් මුල් මුදල එහි පොත් වල දැක්වේ. එබැවින් ආයතන දෙකෙහි පොත්වල දක්වන වටිනාකම නිවැරදිය

## 2.2.4 නීති රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

(අ) මුදල් රෙගුලාසි රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවලට අදාලවේ. අරමුදල මගින් අදාල පරිදි ඒවා අනුකරනය කිරිම පමණක් සිදු කෙරේ. දිනපතා ශිෂ්‍යත්ව ගෙවීම සඳහා උපකුලපතිවරු වෙත ලබා දෙන සෑම චෙක්පතක්ම සෑම විටම ලිඛිතව භාර දී ඇති බැවින් සෑම චෙක්පතක්ම භාර ගත් බවට හැඟවුම් තිබේ. එය විධිමත් පාලනයක් යටතේ සිදු කෙරෙන බැවින් පරිපාටියෙහි දොසක් සිදුනොවේ.

(ආ) මෙය නිවැරදි කර ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

කරුණු පැහැදිලි කිරිමකි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

වෙන් කරනු ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණය සඳහා ප්‍රායෝගිකව ශිෂ්‍යත්ව භාරගන්නා ප්‍රමාණය අතර අඩුවැඩිවීම් අනුව ලබා දෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව වෙනස් වේ. අයදුම්කරුවන් සිටින අවස්ථා වලදි වෙන් කරන ලද මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය ප්‍රදානය කරනු ලැබේ. එම සංඛ්‍යාවද සිසුන්ගේ අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය හා පාඨමාලාවලින් ඉවත්වීම අනුව වෙනස් වේ. ඒවා නියත සංඛ්‍යා නොවේ

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**(අ) ශිෂ්‍යත්ව ලබාදීම.**

(i) විශ්ව විද්‍යාල කිහිපයක පමණනක් පැවති මෙම දූර්වලතා එම ආයතන මගින් නිවැරිදි කර ගනිමින් පවති. නමුත් සෑම මසකම ප්‍රමාදයකින් තොරව ලබා නොගත් වාරික ලේඛන හා මුදල් අප වෙත එවීමට විශ්ව විද්‍යාලවලට නිතර දන්වනු ලැබේ.

(ii) විශ්වවිද්‍යාලවල පාලන ගැටළු හා වර්ජන ආදිය මෙයට බලපා ඇත.

(ආ) පාසල් සංවර්ධන කටයුතු

(I) i මෙම මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාරිපාලනය කරන මුදලකි. නමුත් නිතර පසුවිපරම් කර එය නිවැරදි කර ඇත.

ii මේ වන විට මෙම මුදල් පාසැලෙහි ඉදිකිරිම් සඳහා පරිහරනය කරන බව වාර්තාවේ.

iii ඉදිකිරිම් කටයුතු පළාත් අධ්‍යාපන කාර්යාලය විසින් අරඹා ඇත.

(II) i අනුමත කල මුදල තුල මුදල් ලබාදී ඉදිකිරිමට ක්‍රියාකර ඇත. කටයුතු අවසන් කිරිම සඳහා අතිරේක මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දී ක්‍රියා කලයුතුවේ.

ii ක්‍රිඩා පිටිය ඉදිකල පසුව වැසි සුළග ආදිය නිසා ක්‍රිඩා පිටියෙහි පාංශු බාදනය නිරන්තරව සිදුවන බැවින් තණකොළ සිටුවිම, පස් සේදිම ආදිය වැලැක්විමට දෛනිකව නඩත්තු සිදුකල යුතුය.

## 4.3. අවිධිමත් ගණුදෙණු

වැඩිපුර ගෙවීමක් නැත. ගිවිසුම අනුව පිටපත් ලබාගැනිම කලද, නොකලද අවම පුරස්කාර ගාස්තුව මාසිකව රු.3000/= ගෙවිය යුතුය. අවම ආදායමක් නොමැතිව වටිනා බහුකාර්ය පරිසනක මුද්‍රණ යන්ත්‍රයක් කිසිදු ආයෝජකයකු විසින් කුලියට නොදෙනු ඇත. මෙය ආයතනය දැරිය යුතු අවම පිරිවැයකි. එය මිලදි ගන්නා ලද්දේ නම් ආවස්ථික පිරිවැය එයට වැඩිය. එබැවින් මෙය ඵලදායකය.

## 4.4 මතභේදයට තුඩුදෙන කරුණු

(අ) i. 2011 වර්ෂය සඳහා රු.මි 36 ලාභාංශ පසුව ලබා දී ඇත .

ii. සමාගමක් බැවින් බදු නිදහස හිමි නැත.

(ආ) <u>ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය.</u>

(i) එකඟ වෙමි.

(ii) වාර්ෂිකව මෙම ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

(iii) සංවර්ධන වැඩ අරඹා ඇත.

## 4.5. <u>කාර්යය මණ්ඩල පරිපාලනය</u>

**(අ)** පනත අනුව මහපොළ භරකාර මණ්ඩලය එහි කාර්ය මණ්ඩලය පිළිබද අවසන් අධිකාරියවේ. ගරු අගවිනිසුරු සභාපතිත්වය දරණ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලෙහි භාරකාර මණ්ඩලය විසින් එම පත්කිරිම් භාරකාර මණ්ඩල රැස්විම් වලදි විධිමත් පරිදි අනුමත කර නිළධාරින් සේවයෙහි යොදාගෙන ඇත.

**(ආ)** සේවයේ අවශ්‍යතාව මත එම පත්කිරිම් කර ඇත.

**(ඇ)** භාරකාර මණ්ඩලය මගින් කාර්ය මණ්ඩලයට සේවයට කැපවි ක්‍රියා කරන දැනුම හා පලපුරුද්ද ඇති අය අත්‍යවශ්‍ය බැවින් පවතින සේවක හිඟය පිරිමසා සේවයේ ගුණාත්මක බව සලකා එලෙස පත් කර ඇත.

**(ඇ)** මෙම අරමුදල ඒකාබද්ධ අරමුදලට අයත් නැති බැවින් රාජ්‍ය ව්‍යාපාරයක් නොවේ. එබැවින් එම දෙපාර්තුමේන්තුවෙහි ඍජු පාලනයට අයත් නොවේ. කාර්ය මණ්ඩලයේ වැටුප් හා දිමනා පිළිබඳ වැටුප් හා සේවක කොමිෂන් සභාවේ මග පෙන්විම අනුව එකගත්වය ඇතිව භාරකාර මණ්ඩලය විසින් සිය අභිමතය පරිදි තිරණය කර ඇත.

## 5. <u>පද්ධති හා පාලන</u>

තවදුරටත් ක්‍රියා කිරීමට අවධානයට ගනු ලැබේ.

**අත්සන් කළේ /රංජිත් තේනුවර,**

**අධ්‍යක්ෂ,**

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.**